www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# චීනයේ කිරි අර්බුදය: ධනවාදී වෙළඳ පොළ විසින් මුදා හරින ලද තවත් ව්‍යසනයක්

## China's milk crisis: another disaster unleashed by the capitalist market

**ජෝන් චැන් විසිනි**
**2008 සැප්තැම්බර් 24**

විෂ සහිත කාර්මික රසායන ද්‍රව්‍යයක් වන මෙලමයින් හේතු කොට ගෙන චීන කිරි නිෂ්පාදන දූෂනය වීම ප්‍රධාන ජාතික හා ජාත්‍යන්තර සෝලියක් බවට ශීඝ්‍රයෙන් පත් වෙමින් තිබේ. දූෂිත නිෂ්පාදන ආහාරයට දීමෙන් පසුව චීනයේ ළදරුවන් 53,000ක් පමන දැනට මත් රෝගී බවට පත්ව ඇත. ඉරිදා සෞඛ්‍ය අමාත්‍යංශය කල ප්‍රකාශයකට අනුව, අඩු ගනනේ 12,892ක් රෝහල්ගත කර ඇති අතර ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් වකුගඩුවල ගල් පැවතීම හේතු කොට ගෙන ය.

චීනයේ විශාලතම කිරිපිටි සමාගම වන සන්ලු ගෘප් විසින් නිපදවන ලද ළඳරු කිරිපිටි ආහාරයට දීමෙන් පසුව වකුගඩු ආබාධයක් වැලඳීම හේතු කොට ගෙන ළඳරුවන් සිවු දෙනෙක් ඛේදජනක ලෙස මිය ගොස් තිබේ. ෆොන්ටෙරා නම් දැවැන්ත නවසීලන්ත කිරි සමාගම සන්ලු සමාගමේ කොටස්කරුවකු වන අතර එහි බහුතර කොටස් අයත් වන්නේ ෂිජියාශුආන් නාගරික පරිපාලනයට යි.

කිරිපිටි නිෂ්පාදකයන් කිරි මිලදී ගැනීමේ දී බලාපොරොත්තු වන මට්ටමට ඒවායේ ප්‍රෝටීන් ප්‍රමානය ඉහල දමනු වස් කිරි ගොවීන්ගෙන් ලබා ගන්නා කිරිවලට අතරමැදියන් මෙලමයින් එකතු කර ඇති බවක් පෙනී යයි. 2007 දෙසැම්බර් සිට ම සන්ලු සමාගම මෙම ගැටලුව ගැන දැන සිටි බවත් එහෙත් ඒ සම්බන්ධයෙන් කිසිවක් නොකල බවත් දැන් පැහැදිලි ය. ප්‍රථම දැනගත් මරනය සිදු වූයේ මැයි 1 දා ය. ෆොන්ටෙරා නියෝජිතයන් අගෝස්තු මුල දී කිරිපිටි දූෂිත වීම පිලිබඳව සොයා ගෙන ඒ පිලිබඳව චීන සමාගමේ දේශීය නිලධාරින්ට දැනුම් දුන් බවත් එම නිලධාරින් සමාගමේ නිෂ්පාදන වෙලඳ පොලෙන් ඉවත් කර ගැනීමට කිසිදු පියවරක් නොගත් බවත් පෙනී යයි. නැගෙන උත්සුකතා මධ්‍යයේ, නවසීලන්ත ආන්ඩුව අවසානයේ සැප්තැම්බර් 8 දා බෙයිජිං ආන්ඩුව සමග ගැටලුව ඍජුව ම මතු කලේ ය.

වැඩෙන මහජන වෛරයට මුහුන දුන් තතු යටතේ, චීන ආන්ඩුව වගකීම වෙනතක හැරවීමේ මංමුලා සහගත ප්‍රයත්නයක යෙදී තිබේ. පසුගිය සඳුදා, 2001 සිට තත්ව, අධීක්ෂන, පරීක්ෂන සහ රෝග නිවාරන පිලිබඳ පොදු පරිපාලන ආයතනයේ ප්‍රධානියාව සිටි ලි චැංජියාං ඉල්ලා අස්විය. එමෙන් ම, රාජ්‍ය සභාව, එනම් රටේ කැබිනට් මන්ඩලය, පරීක්ෂනයක් පවත්වන ලෙස අන කොට සන්ලු සමාගමට දොස් පවරමින් ප්‍රකාශයක් නිකුත් කලේ ය. සමාගම "ආන්ඩුවට දැනුම් දුන්නේ වත් අදාල මනා පියවර ගත්තේ වත් නැති" බවත් "එබැවින් තත්වය වඩා නරක අතට හැරවූ" බවත් එම ප්‍රකාශය සඳහන් කලේ ය.

යථා වසයෙන් ගත් කල, අර්බුදය වනාහි, චීන තන්ත්‍රය විසින් පෝෂනය කරනු ලබන නිර්බාධිත වෙළඳ පොල සබඳතාවලට සාමාන්‍ය වැඩ කරන ජනතාවගේ මූලික ජීවන අවශ්‍යතා, මේ අවස්ථාවේ දී, ඔවුන්ගේ දරුවන් සඳහා ආරක්ෂිත ආහාර, සහතික කිරීමෙහි ලා පවත්නා පරිපූර්න නොහැකියාව පිලිබඳ තවත් දර්ශකයකි. සෑම මට්ටමක දී ම, කොමියුනිස්ට් පක්ෂ නිලධරයන් සමග සහයෝගීව ක්‍රියා කරන, පුද්ගලික සමාගම්වල හා රාජ්‍ය සංස්ථාවල අන් සියල්ලට ම ඉහලින් පවත්නා ප්‍රමුඛතාව වන්නේ ජනගහනයේ බහුතරයේ ජීවිත හා සෞඛ්‍යය මත ඇති කරන බලපෑම ගැන නොතකා හැකි උපරිම ලාභ ගරාගැනීම යි.

ආපදාවට ලක් වූ ළඳරුවන් හා දරුවන් සංඛ්‍යාව 53,000ට වඩා බෙහෙවින් ඉහල අගයක් වීමට ඉඩ ඇත. උත්සුක වූ දෙමව්පියෝ සිය දරුවන් පරීක්ෂාවට ලක් කර ගනු වස් චීනය පුරා රෝහල්වල තවමත් පෝලිම් ගැසී සිටිති. එපමනක් නොව, දැන් සන්ලු ගෘප් ආයතනයෙන් ඔබ්බට බොහෝ දුරට විහිදී ඇති නිෂ්පාදන වෙලඳ පොලෙන් ඉවත් කර ගැනීමක්, මිලියන සංඛ්‍යාත පවුල් මත මහත් බලපෑමක් සිදු කරනු ඇත. ඔවුන්ට ළඳරු කිරිපිටිවලට විකල්පයක් නැති වනු ඇත. වැඩ කරන මව්වරුන්ට සිය ළඳරුවන්ට මව්කිරි දෙනු වස් නිවෙස් කරා දිව යාමට බල කෙරෙනු ඇත. ආනයනය කරන ලද කිරි නිෂ්පාදන මිලදී ගනු වස් දේශ සීමාව තරනය කල යමක් කමත් ඇති චීන ගැනුම්කරුවන්ගෙන් හොං කොං සාප්පු පිරී ඇති අයුරු බීබීසී සේවයෙන් විකාශනය කෙරුනි.

වෙලඳ පොලෙන් සියයට 60කට වග කියන ප්‍රමුඛ වෙලඳ නාම තුනක් -- මෙංනියු ඩෙයරි ගෘප්, යිලි ඉන්ඩස්ට්‍රියල් ගෘප් සහ බ්‍රයිට් ගෘප් -- ඇතුලු, සමාගම්

22ක නිෂ්පාදන වෙළඳ පොළෙන් ඉවත් කර ගැනීමට නියම කොට ඇත. දියර කිරි, යෝගට් සහ අයිස් ක්‍රීම් ද මෙලමයින්වලින් දූෂිත වී ඇතැයි සොයා ගෙන තිබේ. චීන කිරි නිෂ්පාදනවලින් තනන ලද පැනි රස කෑමවල සහ ක්ෂනික කෝපිවල ද මෙලමයින් අඩංගු බව සොයා ගෙන ඇති හොං කොං හා ආසියානු රටවල් ගනනාවක් කරා ද සෞඛ්‍ය භීතිකාව පැතිරී තිබේ.

ප්‍රසිද්ධ ගෝලීය වෙළඳ නාමයන් පවා දැන් සැකයට භාජන වී ඇත. ස්විට්සර්ලන්තයේ පාදක නෙස්ලේ සමාගම නිපදවන "ඩෙයරි ෆාර්ම් පියෝ මිල්ක්" නම් නිෂ්පාදනයේ ද අඩු මට්ටම්වලින් වුවත් මෙලමයින් අඩංගු බව හොං කොංහි ආහාර ආරක්ෂක මධ්‍යස්ථානය සොයා ගෙන තිබේ. නෙස්ලේ සමාගම, අදාල කිරි නිෂ්පාදන ළමුන් සඳහා නොව වැඩිහිටි පාරිභෝගිකයන් වෙනුවෙන් බව පවසමින් සිය කිරි අලෙවිය ආරක්ෂා කර ගත්තේ ය. එක්සත් ජනපදයේ පාදක මීඩ් ජොන්සන් වැනි සෙසු ළඳරු කිරිපිටි නිෂ්පාදකයන් පවසා ඇත්තේ චීනය තුල පවතින සිය කම්හල්වල දී තමන් පාවිච්චි කරන්නේ දේශීය කිරි නොව ආනයනික කිරි බවයි. මෙම වෙළඳ නාම බොහෝ චීන පවුල්වලට මිලදී ගත නොහැකි තරම් මිල අධික ය.

මෙලමයින් යනු ප්ලාස්ටික් තැනීමේ දී හා හම් පදම් කිරීමේ දී සාමාන්‍යයෙන් භාවිත කෙරෙන සුදු ස්ඵටික කුඩු වර්ගයකි. පසුගිය වසරේ දී, චීනයෙන් ආනයනය කල මෙලමයින්වලින් දූෂිත සංඝටකයක් ඇමරිකාවේ සුනඛයන් හා බළලුන් දහස් ගනනක් මරා දැමීමෙන් පසුව, එක්සත් ජනපදය සත්ව ආහාර විශාල ප්‍රමානයක් වෙළඳ පොළෙන් ඉවත් කර ගැනීමට පියවර ගත්තේ ය. චීනයේ නිෂ්පාදිත භාන්ඩ සම්බන්ධ ආරක්ෂක සෝලි මාලාවක්, මිනිසුන් දුසිම් ගනනාවක් මරා දැමූ ව්‍යාජ ඖෂධ අනුමත කිරීමට අල්ලස් ගැනීමේ චෝදනාවක් යටතේ, රාජ්‍ය ආහාර හා ඖෂධ පාලනාධිකාරයේ හිටපු ප්‍රධානියා වූ ශෙං ක්ෂියාඕයු නඩු අසා වරදකරු කොට මරන දඬුවමට ලක් කිරීමට තුඩු දුනි.

ශෙං දඬුමීමකු කර ගැනීම යටින් පවත්නා ගැටලුවලට ආමන්ත්‍රනය කිරීමෙහි ලා කිසිවක් කර නොමැති බව දැන් පැහැදිලි ය. එහෙත් චීන තන්ත්‍රය මැතම සෝලිය සම්බන්ධයෙන් පවත්නා මහජන වෛරය සමනය කර ගැනීමේ ප්‍රයත්නයක් ලෙස එම දේශපාලන විධික්‍රමම යොදා ගනී. අඩු ගනනේ 18ක්, බොහෝ සෙයින් කිරි ගොවීන්, අත් අඩංගුවට ගෙන තිබේ. සන්ලු ගෘප් සභාපති ටියාන් වෙන්හුවාට තනතුරෙන් ඉල්ලා අස්වීමට බල කෙරී ඇත. නගරයේ කොමියුනිස්ට් පක්ෂ ලේකම් ඇතුලු, සන්ලු සමාගම පාදක වන ෂිජියාශුආංහි ප්‍රාදේශීය නිලධාරින් ගනනාවක්, තනතුරුවලින් ඉවත් කර තිබේ.

කෙසේ වෙතත්, මෙම පියවර කෝපයට පත් දෙමව්පියන් අස්වසාලීමට සමත් වනු නැත. සිය දරුවා වෛද්‍ය පරීක්ෂාවකට භාජන කිරීමට වැය වූ ගාස්තු වෙනුවෙන් වන්දියක් ලබා ගනු පිනිස ෂිජියාශුආං නගරයේ සන්ලු කාර්යාලයේ පෝලිමක සිටි අයෙක් *ඇසෝෂියේටඩ් ප්‍රෙස්* පුවත් සේවයට මෙසේ පැවසී යඃ "මේ වගේ ලොකු සමාගමකට ගැටලුවක් ඇති වෙනවා නම්, එහෙනම් කවුරු විශ්වාස කරන්නද කියන එක ඇත්තටම මම දන්නෙ නැහැ."

තමා සිය රෝගී දියනිය රැගෙන ජූනි හා අගෝස්තු මාස අතරතුර දී අඩු ගනනේ තෙවතාවක් රෝහල්වලට ගිය බවත් වෛද්‍යවරුන් ඇගේ වකුගඩුවල ගලක් පවතින බව සොයා ගත්තේ එම අවසාන වතාවේ බවත් හුනාන් පලාතේ ශොවු ශිජුන් *රොයිටර්* පුවත් සේවයට පැවසුවා ය. බිල චීන ප්‍රමිතීන්ට අනුව විශාල එකක් විය -- එනම් යුආන් 20,000 (එ.ජ. ඩොලර් 2,900)කි. එහෙත් කිසිවෙක් එය ඇය වෙනුවෙන් ගෙවන්නේ නැත. "ඒ වගේම පස්සේ සංකූලතා හා ගැටලු ඇතිවුනොත් කොහොමද? කවුද ඒවට ගෙවන්නෙ?" ඇය විමසුවා ය.

*සවුත් චයිනා මෝනිං පෝස්ට්* පත්‍රයට අනුව, කිරි අර්බුදය සමග අන්තර්ජාලයේ උත්ප්‍රාසජනක විහිලු මාලාවක් සංසරනය වීමට පටන් ගෙන තිබේ. එක් බ්ලොග් අඩවියක් දෛනික ජීවිතයේ අන්තරායන් ලැයිස්තු ගත කරයිඃ "පාන්දර අවදි වෙලා, පිලිකාකාරක දන්තාලේපවලින් දත් මැදලා, අයඩින් විශාල ප්‍රමානයක් අඩංගු හා මෙලමයින්වලින් දූෂිත කල් ඉකුත් වූ කිරි වීදුරුවක් පානය කරන්න." පාන් මිලදී ගැනීමට වෙළඳ සැලකට යන තැනැත්තෙක් එම පැකැට්ටුවේ කල් ඉකුත් වන දිනයක් සටහන් කර නැත යන්න දකින බව තවත් විහිලුවක සඳහන් වේ. "ඒ ගැන වද වෙන්න එපා. මම ඒක ලියලා දෙන්නම්" යයි කඩහිමියා පවසයි.

නියාමනයට ලක් නොකෙරෙන කිරි කර්මාන්තය

මූලික ආහාර ප්‍රමිතීන් බලාත්මක කිරීමට අසමත් වීම පසුගිය 30 වසර තිස්සේ චීන තන්ත්‍රය විසින් සහයෝගය දෙනු ලැබූ "වෙළඳ පොල ප්‍රතිසංස්කරන" වල ඍජු ප්‍රතිඵලයකි. චීනයේ කිරි නිෂ්පාදන සම්බන්ධයෙන් පැන නැගුනු මුල්ම සෝලිය මෙය නොවේ. 2004 දී, කිසිදු පෝෂනීය අගයක් නැති ව්‍යාජ ළඳරු කිරි ආහාර දීමෙන් පසුව ළඳරුවන් 13ක් මන්දපෝෂනයෙන් මිය ගියහ. කෙසේවෙතත්, ළඳරු කිරි ආහාර කර්මාන්තය වර්ධනය වෙමින් පවතින්නේ, එහි ආදායම 2003 දී තිබූ එ.ජ. ඩොලර් බිලියන 1.4 සිට පසුගිය වසරේ දී ඩොලර් බිලියන 3.1 දක්වා නංවාලමිනි. සෙසු කිරි නිෂ්පාදනවලින් ලද ආදායම එම කාල පරිච්ඡේදය තුල දී ම ඩොලර් බිලියන 17.9 දක්වා දෙගුනයකින් ඉහල ගියේ ය. විදේශ ආයෝජකයන් හා බැංකු මෙම

ලාභදායක අංශයට කඩා වැදී ඇත්තේ, එහි ප්‍රසාරනයක් අවුලුවාලමින් හා ඉහල ලාභ සඳහා පීඩනයක් ද ජනිත කරමිනි.

කිරි සම්ප්‍රදායික චීන ආහාර වේලේ කොටසක් ලෙස පැවතී නැත. කිරි කර්මාන්තය ප්‍රසාරනය වූයේ ජනගහනයේ නිර්ධනීකරනය සමග ය. බොහෝ කාන්තාවන් දැන්, බොහෝ සෙයින් දවසට විශාල පැය ගනනක්, දරුනු සේවා කොන්දේසි යටතේ, වැඩ කරන බැවින්, සිය දරුවන්ට මව්කිරි දෙන ලෙස රෝහල් බලගතු ලෙස මව්වරුන්ට අවවාද කර ඇති මුත්, එසේ මව්කිරි දීම කල නොහැකි ය. බොහෝ තරුන මව්වරු සිය ලදරුවන් තමන්ගේ ගම් පලාත්වලට යවන අතර එහි සිටින ඔවුන්ගේ දූප්පත් දෙමව්පියන් එම දරුවන්ට දෙන්නේ ලාභ කිරිපිටි ය.

චීනයේ බොහෝ දැවැන්ත සමාගම්වලට අතිනවීන ස්වයංක්‍රීය කිරි ගොවිපලවල් ඇති බව *ෆිනෑන්ෂියල් ටයිම්ස්* සැප්තැම්බර් 17 දා ලිවී ය. කෙසේ වෙතත්, එම ගොවිපලවල් නිපදවන්නේ අවශ්‍ය කිරිවලින් ඉතා කුඩා කොටසක් පමනි. "ආදර්ශ ගොවිපලවල් පවතින්නේ, රටේ විශාලතම කිරි සමාගම්වලින් සමහරක් විශ්වාසයට ගෙන ෂැංහයි, හොං කොං හා නිව් යෝර්ක් කොටස් වෙලඳ පොලවල ඒවා ලැයිස්තු ගත කිරීමට උදව් කර ඇති මෝර්ගන් ස්ටැන්ලි හා බීඑන්පී පරිබාස් වැනි පුද්ගලික කොටස් අරමුදල් හා විශාල බැංකු ඇතුලු, විදේශ ආයෝජකයන්ගේ වාසිය පිනිස බවක් පෙනී යයි." යයි පුවත්පත තව දුරටත් පැවසී ය.

බොහෝ සුලු ගොවීහු නව ආදායම් උල්පතක් ලෙස කිරි නිපදවීමට පැන ගත්හ. චීනයේ කිරි නිෂ්පාදනය 2000 දී තිබූ ටොන් මිලියන 8.6 සිට 2006 දී ටොන් මිලියන 32.2 දක්වා ඉහල නැංගේ ය. ධාරිතාවයේ ශීඝ්‍ර වර්ධනය ඉක්මනින් ම ඉල්ලුම ඉක්මවා ගිය තතු තුල සිය නිෂ්පාදනයේ පැවැත්ම උදෙසා පහසුම හා ඉක්මන්ම දේ කිරීම කරා ගොවීන් මෙහෙයවී ය. ආයතන ගනනාවක් කිරි ගොවීන් සමග ගිවිසුම්වලට එලඹුනේ කිරිවල තත්වය පිලිබඳ වැඩි පාලනයක් සමාගම්වලට ලබා දෙමිනි. කෙසේ වෙතත්, ඉල්ලුම පහල වැටුනු කල ගොවීන්ට මුදල් ගෙවීමට සිදු වීම වලකාගනු වස්, බොහෝ ආයතන එසේ කිරීම ප්‍රතික්ෂේප කලහ. සෙසු සමාගම්, ගොවිපලවල් ගනනාවකින් කිරි එකතු කල වෙලෙන්දන්ගෙන් කිරි මිලදී ගත්හ. එමගින් කිරිවල තත්වය තවත් සැක සහිත විය. මෙම වෙලෙන්දන් ඉහලම මිල ලබා දුන් ඕනෑම අයෙකුට සිය කිරි සරලවම අලෙවි කලේ සැපයුම්කරුවන්ට හැකි තරම් සුලු මුදලක් ගෙවමිනි.

ජාතික සංවර්ධන හා ප්‍රතිසංස්කරන කොමිෂමේ නිලධාරියකු වන ෆැන් යාන් *රොයිටර්* පුවත් සේවයට මෙසේ පැවසී යः "කිරි කර්මාන්තයේ අන්ධ ප්‍රසාරනයේ ප්‍රතිඵලයක් ලෙස තත්වය මෙන් ම මෙලමයින් භාවිතය පිලිබඳව ද නොතැකීමක් ඇති විය." නිසි අධ්‍යාපනයක් නොලද ගොවීන් ඔවුන් කලින් ගවයන් සඳහා යොදා ගත් විධික්‍රම ම එලදෙනුන් ඇති කිරීමේ දී ද යොදා ගත් බව ද එහි ප්‍රතිඵලය ලෙස කිරිවල ප්‍රෝටීන් අන්තර්ගතය පහල වැටුනු බව ද ඔහු පැවසී ය. "ඔවුන් කිරි කම්හල්වලට අඩු ප්‍රෝටීන් සහිත කිරි අලෙවි කල විට, ඒවා ප්‍රතික්ෂේප කෙරුනු අතර එහි ප්‍රතිඵලයක් ලෙස සමහරු කිරිවලට මෙලමයින් එකතු කලහ." යයි ඔහු පැවසී ය.

කිරි ගොවීන් ආහාර සෝලි හා අවිනිශ්චිත වෙලඳ පොල හේතු කොට ගෙන දැනටමත් බැට කනු ලැබ ඇත. දැන් බොහෝ දෙනෙකුට සිය කිරි අහක දමා තම එලදෙනුන් විකුනා දැමීමට බල කෙරී ඇත. ෂිජියාශුආන්හි කලින් සන්ලු සමාගමට කිරි සැපයීමට පුරුදු වී සිටි ගොවීන් නව ගැනුම්කරුවන් සොයා ගත් නමුත් ඔවුන්ට අත්දැකීමට ලැබුනේ සෙසු ප්‍රධාන කිරි සංගත ද සෝලියෙන් බැට කා ඇති බව යි.

හුබෙයි පලාතේ යැංජියාශායි ගම්මානයේ ගොවීන් *ඇසෝෂියේටඩ් ප්‍රෙස්* පුවත් සේවයට පැවසුවේ තමන්ගේ කිරි තව දුරටත් කිසිවෙකුට වත් අවශ්‍ය නැති බවයි. "සන්ලු ආයතනය දැන් පවතින ලොකු සමාගම බවට පත් කරන්නේ උදව් කලේ අපි වගේ සුලු ගොවීන් තමයි. ඒත් දැන් සන්ලු සමාගම වැටෙන කොට අපට උදව් කරන්නේ කවුද?" යයි එක් අයෙක් විමසී ය. සිය එලදෙනුන් 12 දෙනාට ආහාර ලබා දෙනු පිනිස තමන් දිනකට ඩොලර් 30ක් ගෙවූ නමුත් දින පහක් තිස්සේ කිරි බිඳක් වත විකුනා ගැනීමට තමන් සමත් නොවූ බව තවත් ගොවියෙක් පැවසී ය. "මම හදන්නෙ මගේ එලදෙනුන් විකුනා දමන්න. මට මේ විදිහට නම් යන්න බැහැ. කවුද දන්නෙ කොච්චර කාලයක් මෙහෙම යාවිද කියලා" යයි ඔහු පැවසී ය.

සන්ලු වනාහි, එහි තත්ව පාලනය කෙතරම් යහපත් දැයි සැලකෙනේනේ නම් එය පිලිබඳ නියාමනයක් අවශ්‍ය නැත යන පදනම මත, තෙවසරක පරීක්ෂා විරාමයක් ලබා දුන් සමාගම් 2,512න් එකකි. ස්වයං-නියාමනය වෙනුවෙන් චීන නිලධාරීන් යොදා ගත්තේ ද එක්සත් ජනපදයේ හා සෙසු රටවල සිටින ඔවුන්ගේ සමානයන් යොදා ගන්නා "නිදහස් වෙලඳ පොල" තර්කයන් ම යः පාරිභෝගිකයන්ට එක් නිෂ්පාදනයක් නුසුදුසු යයි හැගේ නම්, තරගකාරී වෙනත් වෙලඳ නාමයක් මිලදී ගැනීමට ඔවුන්ට නිරතුරුවම හැකි ය. වෙලඳ පොලට හා ලාභ සඳහා වන තල්ලුවට අන් සියල්ල පාලනය කිරීමට ඉඩ දීමෙන්, ඊලග පරම්පරාවේ සෞඛ්‍යය ඇතුලු, නොවැලැක්විය හැකි මානුෂ්‍ය වියදමක් ද සහිතව, පාරිභෝගිකයන්ට හා සුලු නිෂ්පාදකයන්ට මුහුනපෑමට සිදු වන ව්‍යසනකාරී ප්‍රතිවිපාක මැතම කිරි නිෂ්පාදන අර්බුදය මගින් පැහැදිලි කෙරෙයි.

© www.wsws.org